**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

**14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල**

| දිනය<br>Date | 2025.04.22<br>පැය 1820 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/808/2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**“සිරි දළදා වන්දනාව” වෙනුවෙන් බැතිමතුන්ගේ පැමිණීමේ වර්ධනයක්, හෙට දින විශාල බැතිමතුන් ප්‍රමාණයක් පැමිණෙතැයි අපේක්ෂා කෙරේ - පොලිස් මූලස්ථානය.**

“සිරි දළදා වන්දනාව” 2025.04.18 වන දින ආරම්භ කල අතර 2025.04.22 වන අද දින තුල දක්වා විශාල බැතිමතුන් පිරිසක් “දළදා වහන්සේ” වන්දනාමාන කරගෙන ඇත. 2025.04.23 වන හෙට දිනද “සිරි දළදා වන්දනාව” සිදු කර ගැනීම සඳහා අද දින සවස 0600 පමණ වන විට අසූදහසකට අධික සැදැහැවතුන් පිරිසක් මහනුවර නගරය වෙත එක් රැස්ව සිටින අතර හෙට දින උදෑසන වන විට එම ප්‍රමාණය ලක්ෂය ඉක්මවා පැමිණෙනු ඇතැයි අපේක්ෂා කරයි.

එමෙන්ම 2025.04.23 වන හෙට දින දහවල් කාලය වන විට මෙම ප්‍රමාණය තවදුරටත් ඉහල යා හැකි බැවින් හෙට දින හැර තවත් දින 04 ක කාලයක් “සිරි දළදා වන්දනාව” සිදු කර ගැනීමට හැකියාව ඇත. එබැවින් හෙට දිනය මඟහැර ඉදිරි දිනයක් යොදා ගැනීමට කටයුතු කිරීම මගින් බැතිමතුන්ට අපහසුතාවයකින් තොරව වන්දනාමාන කර ගැනීමට හැකියාව පවතින බවට පොලිසිය මහජනතාව වෙත දන්වා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**